## 2017 ජූලි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"එබැවින් ඔබ තුළ ඇති එළිය අඳුරු නොවන ලෙස වග බලාගන්න "**

(ශු.ලූක් 11:35)

එදා ශුද්ධාත්ම මහා මංගල්‍යයට සහභාගි වූ ඔබ / මා ඇතුළු සමස්ථ ජනතාවම දෙවියන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත එළිදරව් කර ගැනීම සඳහා ආත්මයාණන් වහන්සේගේ විශේෂ වැගිරීමක් ලැබූ බව නොඅනුමානය. ඒ මහා අභිරහස්මක සත්‍යතාවය භුක්ති විඳීමට අපට බාධා බොහොමයක් ඇති බව හොඳාකාරව දනිමු. මන්ද යක්ෂයා, ලෝකයා, මාංශයා වන ත්‍රිවිධ සතුරන් අප වටා සැරිසරන බව අපි හොඳින් දන්නා බැවිනි.

> **"සිහිසන් ඇතිව අවදිව ඉන්න**
> **ඔබගේ විරුද්ධකාරයා වන යක්ෂයා**
> **ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිල ගනිම්දෝයි**
> **සොයමින් ඔබ මොබ ඇවිදින්නේ ය."** (1පේදුරු 5:8)

එහෙත් අපි විශ්වාසයේ ආලෝකයෙන් දැල්වී අප තුළ සදහටම වැඩ වසන ආත්මයාණන්ට ඉඩ දෙන තරමට එම අන්ධකාරයේ බල වේගයන්ට යට නොවී ක්‍රිස්තු ආලෝකයට ඇතුළු වීමට අපට හැකිය. එබැවින්, මේ මාසය තුළ විශේෂයෙන් අප තුළ ඇති විශ්වාසයේ ආලෝකයෙන් දැල්වී ශුද්ධාත්ම ආලෝකයෙන් පිබිදී සත්‍යයට සාක්ෂි දැරීමට පෙරමුණ ගනිමු. අප පවුල, අප සංඝය, අප මීසම, ශුද්ධවූ සභාව, මහා පුබුදුව, අප රට, මුළු ලෝකය වෙනුවෙන් අයැදිමු. අන්ධකාරයේ ජීවත් වන අය වෙනුවෙන් විශේෂයෙන් අයැදිමින් මොර ගසමු. යක්ෂයාට අණ කරමින් යාච්ඤා කරමු.

**"අවසාන වශයෙන් ස්වාමින් වහන්සේ තුළ ද ඔවුන් වහන්සේගේ ප්‍රබල ශක්තියෙහි ද බලවත් වන්න. යක්ෂයාගේ සියළු උපායවලට විරුද්ධව සිටින්නට ඔබට පිළිවන් වන පිණිස, දෙවියන් වහන්සේගෙන් සන්නාහයෙන් සන්නද්ධ වන්න. මන්ද, අපගේ සටන මිනිස් සතුරන්ට විරුද්ධව නොව, අධිපතිකම් වලටත්, පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑණින්ටත්, ස්වර්ගීය ස්ථානවල සිටින සකල දුෂ්ඨ බලවේගයන්ටද විරුද්ධවය. එබැවින් නපුරු දවස පැමිණි විට ඊට විරුද්ධව සිටින්නට පුළුවන් වන පිණිසත්, කළ හැකි හැම දෙයක්ම කර ස්ථිරව සිටින්නට පුළුවන් වන පිණිසත් දෙවියන් වහන්සේගේ සන්නාහයෙන් සන්නද්ධව සිටින්න."**

(එපීස 6:10-13)

**අප තුළ ඇති එළිය අඳුරු නොවන ලෙස වගබලා ගැනීමට නම් :**

01. නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන්ට අවදි වන්න.
02. දිනපතාම මගේ පැයට ඇතුළු වීමට කාලය වෙන් කර ගන්න.
03. දිනපතාම දවසේ වචනයට ඇතුළු වන්න. (සුදතුම් ගමන)
04. නිරන්තරයෙන් අයදින්න. අන් අය වෙනුවෙන් මැදහත් වන්න.
05. ප්‍රශංසා එකතුවට, අයැදීමේ එකතුවට සතිපතාම සහභාගි වන්න.
06. සාංඝික පවුල් දිනය අමතක නොකරන්න.
07. හැකිනම් දිනපතාම දිව්‍ය පූජාවලට සහභාගි වන්න.
08. හැකි සෑම විටම පෞද්ගලිකවත්, පොදුවේත් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ පෙනී සිටින්න. දිනපතාම ජපමාලය උච්ඡාරණය කරන්න.
09. සෑම සිකුරාදා දිනවල යාච්ඤාවේ දිනයක් වශයෙන් ගත කරන්න.
10. දිනපතා දහවල් 12.00 සිට 01.00 දක්වා අභ්‍යන්තරයෙන් අයැදීමට සහ මැදිහත් වීමට යොමු වන්න, මේ කාලය තුළ.
11. ඔබට දුරකථනයක් ඇත්නම් තව කෙනෙකුට දේව වචනයක් හෝ දිරි ගැන්වීමේ වචනයක් S.M.S කරන්න. ප්‍රශ්නයකින්, වේදනාවකින්, රෝගයකින් සිටින කෙනෙකුට දුරකථනයෙන් කථා කර යාච්ඤා කරන්න.
12. නිතරම ප්‍රීති වන්න. නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලේදී ස්තූති දෙන්න.

(1තෙසලෝනික 5:16-17)

පළමු සතිය : දිව්‍යමය කියවීම - ශු.ලූක් 11:33-36

අයැදීමට විශේෂ යොමුව :

අන්ධකාරයේ ජීවත් වන සියළු දෙනා සහ අවිශ්වාසයෙන් ජීවත් වන සියළුම දෙනා වෙනුවෙන්. (විනාඩි 5ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව, සුසමට එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* සාංඝික පවුල් දිනය හා වචනයේ සේවකයන් වෙනුවෙන්.
* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්......

දෙවන සතිය : දිව්‍යමය කියවීම - ශු.ජොහාන් 3:16-21

අයැදීමට විශේෂ යොමුව :

කුණු ප්‍රශ්නයෙන් සහ ඩෙංගු උවදුරින් අප රට වැසියන් ආරක්ෂා කෙරෙන පිණිසත්, රජයේ බලධාරීන් සහ මහ ජනතාව මීට වැඩි වැඩියෙන් අවදි වන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* පෝය දින පැවැත්වෙන ළමා සහායිකාවන්ගේ එකතුව සහ දුරස්ථර ප්‍රදේශවල සාංඝික පවුල් දිනය සහ සුරුළි වාර්ෂික දිනය වෙනුවෙන් සහ සංගීත සේවාව වෙනුවෙන්.
* 08-09 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන විවාහ අපේක්ෂක සමුළුවට සහභාගි වන සියළුම යුවල් සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - ශු.ජොහාන් 12:34-36

අයැදීමට විශේෂ යොමුව :

පුබුදු ජනතාවට මේ කාලයේ ශ්‍රාවක සංඝ තුළින් මෙන්ම බාහිරව ශුද්ධවූ සභාව තුළින් එන්නාවූ අභියෝගවලට, දේව කැමැත්තට නතුව මුහුණ දීමට හැකිවන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ජූලි 29 සෙනසුරාදා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ආගමික සමගි සන්ධානයේ සම්මන්ත්‍රණය වෙනුවෙන්. (ප්‍රබෝධයේ සංඝය)

සතරවන සතිය : දිව්‍යමය කියවීම - 1ජොහාන් 1:5-10

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් ........

"ඔබ වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අපට හෙළි කළ මැනව "

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

*****************************